පසුගියදා මව්බිම පුවත්පතේ (01/19) මුල් පිටුවේ ප්‍රධාන සිරස්තලයක් දැක්වී තිබුණේ "1818 කැරැල්ලේදී ඉංග්‍රීසි සුදු ඒජන්තට විදපු ඓතිහාසික ඊතලය මෙන්න" යනුවෙනි. කෙසේ නමුත් දෙවන පිටුවේ තිබූ එම පුවත් වාර්තාවේ දැක්වී තිබුණේ "එවකට සුදු ඒජන්තව සිටි..ඉංග්‍රීසි ජාතිකයාට විදින ලදැයි සැලකෙන දුන්නට යෙදූ ඊතලය පෙරේදා (17දා) සවස සොයාගත් බව උණගොල්ල පුරාණ රජමහ විහාරාධිපති හෙවෙල්වෙල ශ්‍රී සුනන්ද හිමියෝ පැවසූහ" යනුවෙනි. මේ සම්බන්ධයෙන් සමාජ මාධ්‍ය තුළද දැඩි අවධානයක් ලැබී තිබිණි.

මෙහිදී පාඨකයින් ලෙසට අප ඇසිය යුතු පැනයන් කිහිපයකි.

1) මෙම ඊතලය සම්බන්ධයෙන් පුරාවිද්‍යාත්මක පර්යේෂණයක් සිදු කොට, එය සැබවින්ම එම ඓතිහාසික කාලයට අයත් බවට තහවුරු කොටගෙන තිබේද?

2) එසේ නැතිනම් එය ඓතිහාසික ඊතලයක් බව හෝ එම ඉංග්‍රීසි ජාතිකයාට විදින ලදැයි සැලකෙන ඊතලයම බව හෝ නිශ්චිතව පවසන්නේ කුමන පදනමකින්ද?

3) එවැනි කිසිදු පුරාවිද්‍යාත්මක පදනමක් ඊට නොමැති නම්, මුද්‍රිත මාධ්‍යයක මුල් පිටු සිරස්තලයක "1818 කැරැල්ලේදී ඉංග්‍රීසි සුදු ඒජන්තට විදපු ඓතිහාසික ඊතලය මෙන්න" යනුවෙන් දැක්වීම, එය ස්ථිර කොට පැවසීමක් නොවන්නේද?

4) එය පාඨකයා නොමග යැවීමක් නොවන්නේද?

මේ පිළිබඳව ඔබේ අදහස කුමක්ද?

#MediaEthicsSL #lka #SinhalaPress #Divaina